# නාගාර්ජුන, මාධ්‍යමික කාරිකාව හා සුශ්‍රැත සංහිතාව.

එස්. පී. මොල්ලිගොඩ *

නාගාර්ජුන යනු භාරතයේ පහළ වූ ශ්‍රේෂ්ඨ බෞද්ධ දාර්ශනිකයෙකි. එමෙන්ම උන්වහන්සේ ඉතා දක්ෂ වෛද්‍යවරයෙක්ද වන්නේය. දැනට සිදුකර ඇති ඓතිහාසික පර්යේෂණ තුළින් නාගාර්ජුන හිමියන් ක්‍රි. ව. දෙවන හෝ තුන්වන සියවසට අයත් කාලවලදී ජීවත්වන්නට ඇතැයි සැලකේ.(1) ක්‍රි. ව. 1290 - 1364 කාලවලදී විසූ බුස්ටන් නම් ටිබෙට් ජාතික ආචාර්යවරයා දක්වන පරිදි නාගාර්ජුන හිමියන් මහාරාෂ්ඩ ප්‍රාන්තයේ විදර්භ නගරයේ උපත ලබා ඇත. කුඩා අවදියේම නාලන්දාවේ පැවිද්ද ලැබූ එතුමා රාහුලභද්‍ර නම් ගුරු හිමිනමකගෙන් බෞද්ධ අධ්‍යාපනය ලබා එහි විශාරදයෙකු බවට පත්ව ඇත. නාගාර්ජුන හිමිපාණන් මහායාන බුදුදහමේ ආරම්භකයා ලෙස සමහර ඉතිහාසඥයන් සලකන අතර ටිබෙට් ජාතික තාරානාථ ආචාර්යවරයා 1605 දි ලියන ලද බෞද්ධ ඉතිහාස කෘතියේදි නාගාර්ජුන පාදයන් පිළිබඳව පරිච්ඡේදයක් ඇතුළත් කර තිබේ. ඉතා කෙටි කලක් තුළදි බෞද්ධ දර්ශනය ඉතා ගැඹුරින් ප්‍රගුණ කළ මොහු නාගාර්ජුන දර්ශනය නමින් බුද්ධාගම නව දර්ශන තලයක පිහිටුවන ලදි. එතුමාගේ සම්ප්‍රදාය මාධ්‍යමික වූ අතර එම දර්ශනය ශුන්‍යතා දර්ශනය නමින් ප්‍රචලිත විය. එම දර්ශනය ආරම්භක අවදියේදිම චීනයට ව්‍යාප්තව ගිය අතර චීනයේ ඇති ආරම්භක කෘතිවල ද එතුමා පිළිබඳ තොරතුරු සඳහන්වේ. එම ග්‍රන්ථවල සඳහන් තොරතුරු අනුව එතුමා දකුණු ඉන්දියාවේ බ්‍රාහ්මණ පවුලක උත්පත්තිය ලබා පළමුව වේදවේදාංගවලින් සමන්විත බ්‍රාහ්මණ ධර්මය හදාරා ඇත.(2) ඉන්පසු පැවිදි වී ථෙරවාද බුදුදහම හදාරා ඇත. ටිබෙට් හා චීන විස්තරවල සඳහන් වන අයුරින් නාගාර්ජුන පාදයන් ගුප්ත විද්‍යා හා රසායන ක්‍රම ප්‍රගුණ කර එහි බලයෙන් දිර්ඝායුෂ ලැබුවෙකි. සාතවාහන ගෞතමී පුත්‍ර යඥ ශ්‍රී නැමැති ආන්ද්‍රරජුගේ උපදේශකයෙකු හා මිත්‍රයෙකු ලෙස සැලකෙන මොහු ඉතා දක්ෂ ග්‍රන්ථ කතුවරයෙකි. කලක් අමරාවතියේද පසුව මදුරාසියේ ගුන්තූර් දිස්ත්‍රික්කයේ ශ්‍රී පර්වතයේ තැනූ විහාරයක මොහු ජීවත් වී ඇත. ශ්‍රී පර්වතය නාගාර්ජුන කොණ්ඩා නමින් පසුව ප්‍රසිද්ධියට පත්වී ඇත. දක්ෂිණ කොශලාධිපති වූ (මෙකල ඩෙකාන් නමින් ප්‍රසිද්ධ වූ) සතාවාහන රජතුමා ශ්‍රී පර්වතයට සැතපුම් 50 ක් පමණ ගිය තැන බ්‍රහ්මගිරි නම් පර්වතයක තවත් රමණිය ගල්වෙහෙරක් කරවා ඇත. එම වෙහෙර සම්බන්ධයෙන් හියුං සියාංග්‍රමණ වෘත්තාන්තයේ මෙසේ දැක්වේ. "මෙම පර්වතයේ මුදුන් කොටස වනාහි මිනිසුන්ට නැංග නොහැකි බෑවුම් සහිත මහ ගලකි. මෙයට ඇතුළුවීම පිණිස ලි 100 ක් (ලි එකක් අඩි 880 කට සමානවේ) දුරට ගල සාරවා ආවෘත මාර්ගයක් සෑදවිය. මහල් 5 කින් යුත් මෙම ගොඩනැඟිල්ලේ එක් එක් මහලක ශාලා 4 බැගින් වෙති. මෙම ශාලාවල පිළිමවහන්සේලා තැන්පත් කර ඇති අතර ඒවා ඝනරනින් වාස්තු කර ඇත. සකල ලක්ෂණ වලින් පිරි මේ ප්‍රතිමා මැණික් වලින් සරසා ඇත. පර්වතය මුදුනෙන් ගලාබසිනා ගඟුලැලි මේ විහාරයේ එක් එක් මහලේ පිට බරාඳ වටේ කැරකෙමින් ගොස් පිටතට ගලා බසිත්. දහස් ගණන් භික්ෂුන් මෙහි වාසය කළ අතර නාගාර්ජුන තෙර, ත්‍රිපිටකයට අයත් සියලු පොත් හා අටුවා ආදිය එහි තැන්පත් කර ඇත.

නාගාර්ජුන රසශාස්ත්‍ර විද්‍යාවේ පියා ලෙස හඳුන්වන අතර නාගලෝකය සමඟද කිට්ටු සම්බන්ධකමක් දැක්වූ මොහු ශතසාහස්‍රිකා මහා ප්‍රඥාපාරමිතා ග්‍රන්ථයද නාලොවින් ගෙනා බවට ප්‍රචලිතයි. දඹදිව ජග්ගය්‍යපුර නම් ස්ථානයේ දක්නට ඇති ස්තූපයේ ඇති ශිලා ලිපියකද එතුමා පිළිබඳව සඳහන්වේ. චීන මූලාශ්‍ර අනුසාරයෙන් රොබින්සන් පෙන්වා දෙන පරිදි(3) හුයි යුවාන් නම් ආචාර්යවරයාට අනුව නාගාර්ජුන ජීවත් වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් නවවන සියවසේය. මෙම දර්ශනිකයා බුද්ධ පරිනිර්වාණ වර්ෂය ලෙස ගෙන ඇත්තේ ක්‍රි. පූ. 637 යි. ඒ අනුව නාගාර්ජුන ක්‍රි. ව. තුන්වන සිය වසට අයත් පුද්ගලයෙක් සේ සැලකේ. ටි. ආර්. වි මර්ත වැනි උගතුන්ගේ මතය නාගාර්ජුන පාදයන් 2 වන සියවසේ පහළ වූ බවයි.(4) BUDDHIST REMAINS OF ANDHRA AND ANDHRA HISTORY නම් පොත ලියූ කේ. ආර්. සුබ්‍රමනියම් මහතා නාගාර්ජුන තෙරුන් පිළිබඳව, මෙසේ සටහන් කර ඇත. මෙතුමා එකල පැවති වෛද්‍ය නක්ෂත්‍ර ආදි සැම ශාස්ත්‍රයන්ගෙන්ම පරතෙරට පැමිණ සිටියෙකි. රසදියවල විෂ නැසීම, එය භෂ්ම කිරීම, දියමන්ති හා යකඩ භෂ්ම කිරීම පළමුව සොයාගත් මෙම ඉන්දිය රස ශාස්ත්‍රඥයාගේ ආශ්‍රමයද එකල රසායනාගාරයක්ව පැවතිණ. මෙම රස විද්‍යාවේ බලයෙන් අන්‍ය ලෝහ වර්ග රන්බවට හැරවිය හැකි බැවින් මෙතුමා පර්වතයන් පවා රන් බවට පමුණුවා සාතවාහන රජුගේ මනෝරථ සිඩිය කළේයැයි යන හියුං සියං තෙරුන්ගේ කිම සත්‍යයක් විය හැකි යැයි කියයි.(5)

---

* (බී. ඒ. එම්. එස්.) කොළඹ විශ්වවිද්‍යාලය,
දේශිය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය.
දර්ශනපති උපාධි අපේක්ෂිකා
දර්ශන හා මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

නාගාර්ජුන කෘති :-

නාගාර්ජුන පාදයන් විසින් රචිත යැයි සැලකෙන කෘති විශාල සංඛ්‍යාවකි. මූලමධ්‍යමික කාරිකාව, ප්‍රමාණ විද්වංශනි, යුක්තිෂෂ්ටිකා, උපායකෞශල්‍ය, විග්‍රහව්‍යාවර්තිනි, සුශ්‍රැත සංහිතා ප්‍රතිසංස්කරණය, යන පොත් හය ම නාගාර්ජුන හිමි විසින් රචිතයි. සුශ්‍රැත සංහිතාව හැරෙන්නට සෙසු ග්‍රන්ථ සියල්ලම දාර්ශනික ග්‍රන්ථවේ. තාරානාථට අනුව නාගාර්ජුන පාදයන් ලියූ ග්‍රන්ථ 5කි. මූලමධ්‍යමකාරිකාව, යුක්කිශතකය, ශූන්‍යතා සප්තකි, විග්‍රහව්‍යාවර්තනි හා වෛද්‍ය ප්‍රකරණ යනුවෙනි. බුස්ටෝන් නම් දාර්ශනිකයාට අනුව නාගාර්ජුන කෘති 6කි. මූලමධ්‍යමික කාංකාව, ශූන්‍යතා සප්තකි, යුක්තිශතක විග්‍රහව්‍යාවර්තනි, වෛද්‍ය ශාස්ත්‍ර, ප්‍රකරණ හා ව්‍යවහාර සිද්ධි යනුවෙනි. මීට අමතරව නාගාර්ජුන පාදයන් විසින් රචිත යැයි සැලකෙන ග්‍රන්ථ ගණනාවකි. එනම් රත්නාවලි, චතුස්ස්තව, ප්‍රතිත්‍ය සමුත්පාද හෘදය, භවසංක්‍රාන්ති ශාස්ත්‍ර, පඥා දණ්ඩ, සුහෘල්ලේඛා, මහා ප්‍රඥාපරමිතා ශාස්ත්‍ර, දශභූක ශාස්ත්‍ර, දවාදශමුඛ ශාස්ත්‍ර, ඒක ශ්ලෝක ශාස්ත්‍ර , අෂ්ටාදශ ශූන්‍යතා ශාස්ත්‍ර බෝධි සම්භාර ශාස්ත්‍ර,,බෝධි චිතක නිමිත්ත රහිත, බෝධි සත්ව චර්යාවකාර, ධර්මධාතු ස්තොත්‍ර, Explanation of the mahayana, fv - Kai - chen - hsing Sochi - ching හා Huanag - ta - Fa - Yuan - Sung යනුවෙනි.[6]

මෙම ග්‍රන්ථ සියල්ලම නාගාර්ජුන පාදයන්ගේම යැයි පැවසීම දුෂ්කර බව මහාචාර්ය රිචඩ් එච් රොබින්සන් පවසයි.[7] එහෙත් රොබින්සන් දන්වන පරිදි තාරානාථ ආචාර්යවරයා විසින් නම් කරන ලද ග්‍රන්ථවල අන්තර්ගතය, නාගාර්ජුනගේ මූලමධ්‍යමික කාරිකාවේ අන්තර්ගතය හා ගැලපෙන බැවින් නිසැකවම ඒවා නාගාර්ජුන කෘති ලෙස පිළිගත හැකි බවයි. ඊට අමතරව රත්නාවලි, චතුස්ස්තව, ප්‍රතිත්‍ය සමුත්පාද හෘදය, භවසංක්‍රාන්ති ශාස්ත්‍ර යන ග්‍රන්ථ චන්ද්‍රකිර්ති නම් සුප්‍රකට අටුවාචාර්ය වරයා විවිධ පාඨ උපුටා දක්වන බැවින්ද ඒවා නාගාර්ජුන ලියූ පොත් සේ පිළිගත හැකි බව පෙන්වයි. සුහෘල්ලේඛා ක්‍රි. ව. 5 වන සියවස වන විට දෙවරක්ම චීන බසට පරිවර්තනය වී ඇති බැවින් එයද නාගාර්ජුන කෘතියක් සේ පිළිගනී. නාගාර්ජුන තෙරණුවෝ බෞද්ධ මහාචාර්යවරයෙකු වශයෙන් පමණක් නොව ආයුර්වේද ග්‍රන්ථ සම්පාදකයෙකු ලෙස කීර්තිමත් නාමයක් ලැබූවෙකි. එතුමා කල ග්‍රන්ථ නාමාවලියේ පෙනෙන යෝගශතකය, ආමිනායිමඤ්ජරී යන පොත් දෙක ආයුර්වේද ග්‍රන්ථ වේ. කවිරජා දුර්ගනාරායනසේන කවිභූෂණ පඬිවරයා කියන්නේ දැන් පවත්නා සුශ්‍රැතය නාගාර්ජුන තෙරුන් විසින් සම්පාදිත බවයි. නාගාර්ජුන කාලයට පෙර එනමින් වෛද්‍ය ග්‍රන්ථයක් තිබුණ නමුත් ඒ තෙර එය සකස් කොට අභිවෘද්ධියට පමුණුවා, පරිච්ඡේදවලට බෙදී යැයිද, එතුමන් විසින් ගැලපූ උත්තර තන්ත්‍රය නම් ඉතා වැදගත් කොටස, එයට එක් කළේ යැයිද සලකත්. භික්ෂූන් විසින් ශුද්‍රයන්ට වෛද්‍ය ශාස්ත්‍රය ඉගැන්වීම තහනම් කරන ලද මුත් නාගාර්ජුන තුමා

කුලගුණ සම්පන්නනම් - ශුද්‍රමපි අධ්‍යාපනයක් යන වචනවලින් ඔවුන්ටද එය ඉගැන්විය යුතු යැයි නියම කළේය. භික්ෂූන් අතර පවත්නා කුල බෙදීම යුක්තියක් නැති බවත් ප්‍රකාශ කළේය.[8]

මීට අමතරව චීනයේ ත්සෑං හිමියන් සඳහන් කරන පරිදි නාගාර්ජුන පාදයන්ගේ ශූන්‍යතාව ගැබ් වී ඇති ඉන්දියානු ග්‍රන්ථ ලෙස ලංකාවතාර සූත්‍රය, ශ්‍රීමාලාදේවී, අනූනත්වා පූර්ණත්ව නිර්දේශ යන සූත්‍රයන් හා මහායාන සංග්‍රහ සහ උත්තර තන්ත්‍ර යන කෘතීන් දැකිමට හැකියි.[9]

මෙහිදී සඳහන් වන උත්තර තන්ත්‍රයේ අඩංගු කරුණු මොනවාදැයි පිළිබඳව ප්‍රමාණවත් කරුණු නොතිබුණද සුශ්‍රැත සංහිතාව වෙනුවෙන් නාගාර්ජුන පාදයන් එකතු කරන ලදැයි සැලකෙන උත්තර තන්ත්‍රය හා යම් සම්බන්ධයක් තිබේදැයි සලකා බැලීම වටී, එමෙන්ම මෝක්ෂමාණික්‍යාභරණය නැමැති මහායාන දාර්ශනික ග්‍රන්ථයේද උත්තර තන්ත්‍රය පිළිබඳව කරුණු දැක්වේ. එහි අන්තර්ගත උත්තර තන්ත්‍රයෙන් උපුටා ගන්නා ලද පාඨය මෙසේය.

"නොවෙනස් වන ස්වභාවයෙන් යුතු වූ තථතාව තුළ සම්බුද්ධ කාය පැතිර පවත්නා නිසාත්, පවුල් වල පැවැත්ම තිබෙන නිසාත්, සියලුම සත්වයෝ නිරතුරුවම බුද්ධ ස්වභාවයෙන් යුක්ත වූවාහු වෙති."[10]

ඉහත දත්ත අනුව මෙම උත්තර තන්ත්‍රයේ මහායාන දාර්ශනික කරුණු අන්තර්ගතව ඇතැයි සැලකිමට පුළුවන.

මූලමාධ්‍යමික කාරිකාව :-

මූලමාධ්‍යමික කාරිකාව යනු නාගර්ජුන හිමියන් විසින් රචිත ඉතා විශිෂ්ටතම දාර්ශනික ග්‍රන්ථයයි. භාරතයේ පහළ වූ වෙනස් දාර්ශනික බෞද්ධ ග්‍රන්ථ අතුරින් ඉතා ශ්‍රේෂ්ඨ ම ග්‍රන්ථය මෙය බව නූතන විද්වතුන්ගේ මතයයි. බෞද්ධ උගතුන්ගේ විවිධාකාර විචාරයන්ට බඳුන් වූ මෙ. ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කෘතියක්ද

වන්නේය. මෙහි අන්තර්ගත දාර්ශනික කරුණු අවබෝධ කර ගැනීමේ දී ඇති වූ පරස්පරතාවන් නිසා මූලමධ්‍යමික කාරිකාවට විවිධ අර්ථකථනවලින් අටුවාටිකා ලියවී ඇත. මුලින්ම මූලමධ්‍යමික කාරිකාවේ දර්ශනය පැහැදිලි වන සේ කෘති ඉදිරිපත් කළේ නාගබෝධි හෙවත් තථාගතභද්‍ර නම් වූ නාගාර්ජුන පාදීන්ගේ ප්‍රධාන ශිෂ්‍ය හිමිනමකි. මීට අමතරව බුද්ධපාලිත හා භාව විවේක යන ආචාර්යවරුන් විසින් මෙම කාරිකාවට අටුවා සපයන ලදි. ක්‍රි. ව. (470 - 570) බුද්ධ පාලිත හිමියන්ගේ කෘතිය දැනට ටිබෙට් බසින් පවතින අතර එමගින් ඔහු නාගාර්ජුන දර්ශනය ප්‍රසංගවාදයක් ලෙස දක්වයි. (reductio and absurdum) ප්‍රසංගවාදයක් ලෙසින් හඳුන්වනු, ලබන්නේ ස්වමතය ඉදිරිපත් නොකර, ප්‍රතිවාදි මතයේ ඇති අභ්‍යන්තරික හා තාර්කික ප්‍රති විරෝධතා පෙන්වමින් නිෂ්ප්‍රභ කිරීම හෙවත් බිඳ හෙලීමයි.

සුශ්‍රැත සංහිතාවට පැහැදිලි ලෙසම නාගාර්ජුන ආචාර්යවරයා එකතු කරන කොටස ලෙස සැලකෙන උත්තර ස්ථානයෙහි 65 වෙනි අධ්‍යායයෙහි තන්ත්‍ර යුක්ති පිළිබඳව කෙරෙන විස්තරයේදි තන්ත්‍රයුක්ත 32 න් එකක් වශයෙන් "ප්‍රසංගලක්ෂණ දක්වයි. මෙහිදි ප්‍රසංග ලක්ෂණ ලෙස නාගාර්ජුන විස්තර කර ඇත්තේ ප්‍රකරණාන්තරයෙකලා ස්ථාපනය කිරීම හෝ ප්‍රකරාණාන්තරයෙකු වූ අර්ථය නැවත නැවතත් කියනු ලැබීමයි. සමානපය ප්‍රසංග නම් උදාහරණයක් මෙසේය. "පුරුෂයා පංචම හා භූත ශරීර සමවාය යැ, ඒ පුරුෂ කෙරෙහිම ක්‍රියාව (ශාස්ත්‍රයෙහි කියූ චිකිත්සාව) වේ. රෝග ස්වාස්ථ්‍යය දෙකේ ආශ්‍රයාසථානය පුරුෂයා හෙයිනි වේදෝත්පත්ති අද්ධ්‍යායයෙහි) පුරුෂයා පඤ්ච හා භූත ශරීර සමවාය යැ කියූ හෙයින් කර්ම පුරුෂයා පුරුෂයා ම යැ, චිකිත්සාව ඒ පුරුෂයා අධිපති කොට පවත්නිය යන මැයිනි.[11]

මූලමාධ්‍යමික කාරිකාවේ පරිච්ඡේද 27 කි. ඒවායේ අඩංගු ශ්ලෝක 448කි. මෙහි සෑම පරිච්ඡේදයෑ නාමකරණයේදි "පරික්ෂා" යන වචනය භාවිතා කෙරේ. කරිකාවේදි පරීක්ෂා කරනු ලබන විෂය අනුපිළිවෑ මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රත්‍ය පරික්ෂා | :- | හේතු ඵල වාදයෙහි මූලික කරුණක් වන ප්‍රත්‍යය ලෙ හේතු පිළිබඳව පරීක්ෂාව. |
| 02. | ගතාගත පරික්ෂාවූ | :- | චලනය වූ හා චලනය නොවූ වස්තු (හා පුද්ගලයෑ පිළිබඳ පරීක්ෂාව. |
| 03. | චක්ෂුරින්‍ද්‍රිය පරික්ෂාව | :- | ඇස් ඉන්ද්‍රියය පරීක්ෂා කිරීම. |
| 04. | සකන්ධ පරික්ෂාව | :- | මනුෂ්‍යයාගේ ස්කන්ධ සංයුතිය පරීක්ෂා කිරීම. |
| 05. | ධාතු පරික්ෂාව | :- | පෘථිවි ආදි ෂඩ් ධාතු පිළිබඳ පරීක්ෂාව. |
| 06. | රාග රක්ත පරික්ෂාව | :- | ඇලීම හා ඇලුණු බව හෝ ඇලුණු පුද්ගලයා ළි පරීක්ෂාව. |
| 07. | සංස්කෘත පරික්ෂාව | :- | හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් ධර්ම පිළිබඳ පරී |
| 08. | කර්ම කාරක පරික්ෂාව | :- | ක්‍රියාව හා එය කරන්නා පිළිබඳ පරීක්ෂාව. |
| 09. | පුර්ව පරික්ෂාව | :- | ක්‍රියාව කරන්නාවූ පුද්ගලයාගේ පූර්ව පැවැත් පරීක්ෂාව. |
| 10. | අග්නිධන පරික්ෂාව | :- | ගින්න හා ඉන්ධන පිළිබඳ පරීක්ෂාව. |
| 11. | පූර්වපර කෝටි පරික්ෂාව | :- | ආරම්භක හා අවසන් කෙළවර පිළිබඳ පරී |
| 12. | දුක්ඛ පරික්ෂාව | :- | දුක පිළිබඳ පරීක්ෂාව. |
| 13. | සංස්කාර පරික්ෂාව | :- | සංස්කාර ධර්ම පිළිබඳ පරීක්ෂාව. |

වන්නේය. මෙහි අන්තර්ගත දාර්ශනික කරුණු අවබෝධ කර ගැනීමේ දී ඇති වූ පරස්පරතාවන් නිසා මූලමධ්‍යමික කාරිකාවට විවිධ අර්ථකථනවලින් අටුවාටිකා ලියවී ඇත. මුලින්ම මූලමධ්‍යමික කාරිකාවේ දර්ශනය පැහැදිලි වන සේ කෘති ඉදිරිපත් කළේ නාගබෝධි හෙවත් තථාගතභද්‍ර නම් වූ නාගාර්ජුන පාදින්ගේ ප්‍රධාන ශිෂ්‍ය හිමිනමකි. මීට අමතරව බුද්ධපාලිත හා භාව විවේක යන ආචාර්යවරුන් විසින් මෙම කාරිකාවට අටුවා සපයන ලදි. ක්‍රි. ව. (470 - 570) බුද්ධ පාලිත හිමියන්ගේ කෘතිය දැනට ටිබෙට් බසින් පවතින අතර එමඟින් ඔහු නාගාර්ජුන දර්ශනය ප්‍රසංගවාදයක් ලෙස දක්වයි. (reductio and absurdum) ප්‍රසංගවාදයක් ලෙසින් හඳුන්වනු, ලබන්නේ ස්වමතය ඉදිරිපත් නොකර, ප්‍රතිවාදි මතයේ ඇති අභ්‍යන්තරික හා තාර්කික ප්‍රති විරෝධතා පෙන්වමින් නිෂ්ප්‍රභ කිරීම හෙවත් බිඳ හෙලීමයි.

සුශ්‍රැත සංහිතාවට පැහැදිලි ලෙසම නාගාර්ජුන ආචාර්යවරයා එකතු කරන කොටස ලෙස සැලකෙන උත්තර ස්ථානයෙහි 65 වෙනි අධ්‍යායයෙහි තන්ත්‍ර යුක්ති පිළිබඳව කෙරෙන විස්තරයේදී තන්ත්‍රයුක්ත 32 න් එකක් වශයෙන් "ප්‍රසංගලක්ෂණ දක්වයි. මෙහිදී ප්‍රසංග ලක්ෂණ ලෙස නාගාර්ජුන විස්තර කර ඇත්තේ ප්‍රකරණාන්තරයෙකලා ස්ථාපනය කිරීම හෝ ප්‍රකරාණාන්තරයෙකු වූ අර්ථය නැවත නැවතත් කියනු ලැබීමයි." සමානපය ප්‍රසංග නම් උදාහරණයක් මෙසේය. "පුරුෂයා පංචම හා භූත ශරීර සමාවාය යැ, ඒ පුරුෂයා කෙරෙහිම ක්‍රියාව (ශාස්ත්‍රයෙහි කියූ චිකිත්සාව) වේ. රෝග ස්වාස්ථ්‍යය දෙකේ ආශ්‍රයාසථානය පුරුෂයා හෙයිනි." වේදෝත්පත්ති අද්ධ්‍යායයෙහි) පුරුෂයා පඤ්ච හා භූත ශරීර සමවාය යැ කියූ හෙයින් කර්ම පුරුෂයා ඒ පුරුෂයා ම යැ, චිකිත්සාව ඒ පුරුෂයා අධිපති කොට පවත්නිය යන මැයිනි.[11]

මූලමාධ්‍යමික කාරිකාවේ පරිච්ඡේද 27 කි. ඒවායේ අඩංගු ශ්ලෝක 448කි. මෙහි සෑම පරිච්ඡේදයක්ම නාමකරණයේදී "පරීක්ෂා" යන වචනය භාවිතා කෙරේ. කරිකාවේදි පරීක්ෂා කරනු ලබන විෂය අනුපිළිවලින් මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රත්‍ය පරීක්ෂා | :- | හේතු ඵල වාදයෙහි මූලික කරුණක් වන ප්‍රත්‍යය හෙවත් හේතු පිළිබඳව පරීක්ෂාව. |
| 02. | ගතාගත පරීක්ෂාව | :- | චලනය වූ හා චලනය නොවූ වස්තු (හා පුද්ගලයන්) පිළිබඳ පරීක්ෂාව. |
| 03. | චක්ෂුරින්‍ද්‍රිය පරීක්ෂාව | :- | ඇස් ඉන්ද්‍රියය පරීක්ෂා කිරීම. |
| 04. | සකන්ධ පරීක්ෂාව | :- | මනුෂ්‍යයාගේ ස්කන්ධ සංයුතිය පරීක්ෂා කිරීම. |
| 05. | ධාතු පරීක්ෂාව | :- | පෘථිවි ආදි ෂඩ් ධාතු පිළිබඳ පරීක්ෂාව. |
| 06. | රාග රක්ත පරීක්ෂාව | :- | ඇලීම හා ඇලුණු බව හෝ ඇලුණු පුද්ගලයා පිළිබඳ පරීක්ෂාව. |
| 07. | සංස්කෘත පරීක්ෂාව | :- | හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් ධර්ම පිළිබඳ පරීක්ෂාව. |
| 08. | කර්ම කාරක පරීක්ෂාව | :- | ක්‍රියාව හා එය කරන්නා පිළිබඳ පරීක්ෂාව. |
| 09. | පූර්ව පරීක්ෂාව | :- | ක්‍රියාව කරන්නාවූ පුද්ගලයාගේ පූර්ව පැවැත්ම පිළිබඳ පරීක්ෂාව. |
| 10. | අග්නින්ධන පරීක්ෂාව | :- | ගින්න හා ඉන්ධන පිළිබඳ පරීක්ෂාව. |
| 11. | පූර්වපර කෝටි පරීක්ෂාව | :- | ආරම්භක හා අවසන් කෙළවර පිළිබඳ පරීක්ෂාව. |
| 12. | දුක්ඛ පරීක්ෂාව | :- | දුක පිළිබඳ පරීක්ෂාව. |
| 13. | සංස්කාර පරීක්ෂාව | :- | සංස්කාර ධර්ම පිළිබඳ පරීක්ෂාව. |

| | | | |
|---|---|---|---|
| 14. | සංසර්ග පරීක්ෂාව | :- | ඉන්ද්‍රිය හා අරමුණු අතර සම්බන්ධය පිළිබඳ පරීක්ෂාව. |
| 15. | ස්වභාව පරීක්ෂාව | :- | ස්ව - භාවය පිළිබඳ පරීක්ෂාව. |
| 16. | බන්ධන මෝක්ෂ පරීක්ෂාව | :- | බැඳීම හා ඉන් නිදහස් වීම යන කරුණු පරීක්ෂා කිරීම. |
| 17. | කර්මඵල පරීක්ෂාව | :- | කර්මයෙහි විපාක පිළිබඳ පරීක්ෂාව. |
| 18. | ආත්ම පරීක්ෂාව | :- | ආත්ම සංකල්පය පිළිබඳ පරීක්ෂාව. |
| 19. | කාල පරීක්ෂාව | :- | කාලය පිළිබඳ පරීක්ෂාව. |
| 20. | සාම ග්‍රී පරීක්ෂා | :- | හේතුව හා ඵලය අතර ඇති සමගිය පිළිබඳ පරීක්ෂාව. |
| 21. | සම්භව විභව පරීක්ෂා | :- | ඇතිවීම හා නැතිවීම පිළිබඳ පරීක්ෂාව. |
| 22. | තථාගත පරීක්ෂාව | :- | තථාගතයන් වහන්සේ පිළිබඳ පරීක්ෂාව. |
| 23. | විපර්යාස පරීක්ෂාව | :- | මනසෙහි පවත්නා වූ විකෘති කර ධර්ම (විපල්ලාස) පිළිබඳ පරීක්ෂාව. |
| 24. | ආර්ය සත්‍ය පරීක්ෂාව | :- | සතර ආර්ය සත්‍ය පිළිබඳ පරීක්ෂාව. |
| 25. | නිර්වාණ පරීක්ෂාව | :- | නිවන පිළිබඳ පරීක්ෂාව. |
| 26. | ද්වාදශාංග පරීක්ෂාව | :- | ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි අංග 12 පිළිබඳ පරීක්ෂාව. |

බෞද්ධ දර්ශනයෙහි අන්තර්ගත සියලුම වැදගත් සිද්ධාන්ත නාගාර්ජුන හිමියන් විසින් මෙහිදි සාකච්ඡා ඇති අතර එම සාකච්ඡා අන්තර්ගත කිරීමෙන් එතුමා අපේක්ෂා කරන්නට ඇත්තේ තම දර්ශනික ක්‍රමය පාඨකයා හට පැහැදිලි කිරීම විය යුතුයි. නාගාර්ජුන පාදයන්ගේ මූලික දර්ශනය ශූන්‍යතාව වන හෙයින් මෙමගින්ද ශූන්‍යතාව පිළිබඳ කරුණු තහවුරු කිරීමට එතුමා උත්සහ ගත් බව පෙනේ. මූලමාධ්‍යමිකකාරිකාවේ පරිච්ඡේද ඉදිරිපත් කර ඇති සංවිධානාත්මක බව කෙරෙහි බොහෝ අර්ථ කථාකරුවන් විවිධ මත පළ කර ඇත. චන්ද්‍රකීර්ති නම් වූ අර්ථකථාචාර්යයන් පෙන්වා දෙන පරිදි එහි පරිච්ඡේද අතර පැහැදිලි අන්තර් සම්බන්ධයක් ඇත.

මේ පිළිබඳව මහාචාර්ය කලුපහනයන් දක්වන අදහස් වන්නේ, පළමු හා දෙවන පරිච්ඡේදයන්හි බුදුදහමේ මූලික ඉගැන්වීම් අන්තර්ගත බවයි. එනම් ප්‍රත්‍යතාව හා අනිත්‍යතාව පිළිබඳවයි.[12] 3 - 15 තෙක් පරිච්ඡේද තුළින් ධර්මනෛරාත්මයතාව තහවුරු කිරීමේ අරමුණක් දක්නට ඇති බවද මහාචාර්යය කලුපහනයන් අදහස් කරයි. 16 සිට 26 පරිච්ඡේද මඟින් පුද්ගල නෛරාත්මයතාව තහවුරු කිරීමට උත්සාහ කොට ඇති බවත් 27 වෙනි පරිච්ඡේදයෙහි, ග්‍රන්ථයෙහි සමස්ත නිගමන අන්තර්ගත කර ඇති බවත් දක්වයි.

මූලමධ්‍යමික කාරිකාවේ දැඩි අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පරිච්ඡේද අතර නැති බව ක්‍රිස්ලන්ඩ්ටිනර් අදහස් කරයි. එම පරිච්ඡේද අතර ලිහිල්ව බැඳුණු සම්බන්ධතාවක් ඇති බව ඔහු පෙන්වා දෙයි.[13] ලින්ඩ්ම්නර් පවසන අයුරින් අවසන් පරිච්ඡේද තුළින් නාගාර්ජුන පාදයන් තමා හොඳ බෞද්ධයෙකු බව සනාථ කරයි.

ශූන්‍යතාවාදය ඉදිරිපත් කිරීම සඳහා නාගාර්ජුන පාදයන් විසින් අනුගත දාර්ශනික ක්‍රමවේදය අප විසින් තේරුම් ගැනිම අවශ්‍ය වේ. එම ක්‍රම වේදයන්හි ඉඳහන් 'පරීක්ෂාව' යන්න නූතන බටහිර දර්ශනයේ ප්‍රමුඛයෙකු මෙන්ම ආදිකර්තෘවරයෙකු වූ ලුඩ්විග් විට්ගන්ස්ටෙන් ගේ කෘතියක් වන "Philosophical Investigations" නම් කෘතියේ නාමයට යම් සාම්‍යතාවක් දක්නට ඇති බව මහාචාර්ය අසංග තිලකරත්න පෙන්වා දෙයි. නාගාර්ජුන පාදයන් හා විට්ගන්ස්ටෙන් සංසන්දනය කිරීමත්, මෙයින් සිදු නොකරන අතර දාර්ශනික කාර්යයෙහි පරමාර්ථය අතින් බලන විට එම දෙපළ අතර සැසඳීමට කරුණක් තිබේ ද යන්න සැක සහිත වුවත්, දාර්ශනික කාර්යය කිරීමෙහි ලා අනුගත ක්‍රමවේදය අතින් එක්තරා සමානකමක් පවත්නා බව පිළිගත හැකියි.[14]

මූලමධ්‍යමික කාරිකාවට කරන ලද නූතන අර්ථකථන මගින් ප්‍රාසංගික හා ස්වත්‍රාන්තික සීමාවන් බැහැර කර ඇති බවත් දක්නට ලැබේ. මෑත යුගයේදි නාගාර්ජුන දර්ශනය අර්ථකථනය කළ කෘති අතර T. R. V මූර්තිගේ The Central Philosophy of Buddhism නම් කෘතිය විශේෂ ස්ථානයක් ගනී. මූර්ති විස්තර කරන පරිදි නාගාර්ජුන හිමි තම දාර්ශනික ක්‍රමය මගින් තර්කානුසාරී චින්තනයෙහි හෙවත් තර්කයෙහි සීමාව (reasoning) විදහා දක්වා ඇත. මූර්ති දක්වන පරිදි ප්‍රපංච ලෝකය පිළිබඳව බුදුන්වහන්සේ පසක් කරගත් සත්‍යය නාගාර්ජුන හිමියන් පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇත. බටහිර දර්ශනය තුළ නාගාර්ජුන පාදයන් හා සමාන අවස්ථාවක් ලෙස මූර්ති දකින්නේ එමානුවෙල් කාන්ට් නම් දාර්ශනිකයාය.

කාන්ට් හා මධ්‍යමක යන දෙදෙනා හට විචාරය ම දර්ශනය වේ. මනෝවිකල්පිත පාරභෞතික වාදය සිදුවිය නොහැක්කක් යන අපේක්ෂාභංගකාරී නිගමනයකට මෙම දෙදෙනාම පැමිණෙති. මනෝ විකල්පනය අපට ඥානය නොදේ. දෙන්නේ මායාවයි. කාන්ට් හෝ මාධ්‍යමකට තමන්ගේම යැයි කිව හැකි සිද්ධාන්තයක් නැත.[15]

නාගාර්ජුන පාදයන්ගේ දාර්ශනික ක්‍රම වේදය මූර්ති තවදුරටත් මෙසේ විග්‍රහ කරයි. මධ්‍යමිකයන් විසින් සියලුම දෘෂ්ටියන් බැහැර කිරීම පිළිබඳව භාවිතා කරන අවිය නම් එහි ඇති ස්වයං ප්‍රතිවිරෝධී බව පෙන්වා දීමයි. ද්විඝටනාත්මක වාදය නම් ප්‍රාසංගික තර්ක සමූහයකි. ඕනෑම මතයක් එයට එරෙහිව යොදාගනු ලැබේ. මධ්‍යමක යනු ප්‍රසංගිකයෙන්ද විතණ්ඩවාදියෙන්ද, ද්විඝටනාත්මක තාර්කිකයෙක් මෙන්ම නිදහස් විවාද කරුවෙක්ද වෙයි. මධ්‍යමක තෙමේ පරමතය නිෂ්ප්‍රභ කරයි. එහෙත් තමාගේ යැයි කිවහැකි කිසිදු මතයක් තහවුරු නොකරයි.

නූතනයේ නාගර්ජුන මතය පිළිබඳව කැපී පෙනෙන අදහසක් ඉදිරිපත් කර ඇත්තේ ඒ. කේ. වෝඩර් නම් විද්වතාය. නාගාර්ජුන මාහායානිකයෙක්ද යනුවෙන් ප්‍රශ්න කර ඇති මොහු නාගාර්ජුන විසින්ම ලියන ලදැයි සැලකෙන කෘති මහායාන අදහස් විරල බව පෙන්වා දෙයි. නාගාර්ජුන මූලමධ්‍ය මත කාරිකාවෙහිදි දක්වා ඇති එකම බෞද්ධ සූත්‍රය නම් සංයුක්ත නිකායෙහි නිදාන සංයුක්තයෙහි අන්තර්ගත කච්චායන ගොත්ත සූත්‍රයයි.එතුමා එකම මාහායාන සූත්‍රයක් හෝ මධ්‍යමක කාරිකාවේදි සඳහන් නොකරන බව වෝඩර් පෙන්වා දෙයි. වෝඩර් ගේ මතය අනුව නාගාර්ජුන පාදයන් හිනයානයෙකු හෝ මහායානයෙකු නොව බුදුරජුන්ගේ ඉගැන්වීම පදනම් කොට ගෙන අළුත් හා පැරැණි නිකාය එකමුතු කිරීමට දැරූ කෙනෙකි.

<u>සුශ්‍රැත සංහිතාව :-</u>

සුශ්‍රැත සංහිතාව වූ කලි ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ ප්‍රධානතම ග්‍රන්ථයකි. මෙහි අඩංගු කරුණු බෙහොමයක් ශල්‍ය චිකිත්සාවට අයත් හෙයින් මෙය ශල්‍ය ග්‍රන්ථයක් ලෙස ප්‍රකටය. සුශ්‍රැතය ධන්වන්තරී සම්ප්‍රදායට අයත් ග්‍රන්ථයකි. රාජර්ෂි ධන්වන්තරී ආචාර්යවරයාට ප්‍රධාන ශිෂ්‍යයන් දොළොස් දෙනෙකි. එනම් සුශ්‍රැත, ඖපධේනව, වෛතරණ, ඖරභ්‍ර , පෞෂ්කලාවත, කරවීර්ය, ගෝපුරරක්ෂිත, නිමි, කාංකායන, ගාර්ග්‍ය, ගාලව යනුවෙනි. ඉහත ශිෂ්‍යන් දොලොස් දෙනාම ග්‍රන්ථ 12 ක් වෙන වෙනම රචනා කර තිබේ.ධන්වන්තරීගේ ප්‍රධාන ශිෂ්‍යකු වූ සුශ්‍රැත විසින් ලියන ලද ග්‍රන්ථය සෞශ්‍රැතතන්ත්‍ර නමින් ප්‍රසිද්ධියට පත්විය. එම ග්‍රන්ථය පසුකලෙක ප්‍රතිසංස්කරණය කරණ ලද්ලේ නාගාර්ජුන ආචාර්යවරයා විසිනි. එය සුශ්‍රැත සංහිතාව නමින් ප්‍රචලිත වූ අතර මුල් සුශ්‍රැත තන්ත්‍රය හඳුනාගැනිමට පහසු වන ලෙසින් වෘද්ධ සුශ්‍රැතය නමින් ප්‍රචලිත විය. වෘද්ධ සුශ්‍රැතය හා සුශ්‍රැතය යන ග්‍රන්ථ 2 ම එකක්යැයි සමහරු කියති. නමුත් මෙම ග්‍රන්ථවලින් කරුනු ලබන උපුටා ගැනිම් වලදි වෘඬ සුශ්‍රැතයෙන් උපුටාගත් පාඨ වෙන ම දක්වන්නේ ඇයි දැයි ගැටළුවක් මතුවේ. දැනට මෙහි සූත්‍රස්ථානය, නිදාන ස්ථානය, ශරීරස්ථානය, චිකිත්සා ස්ථානය, කල්ප ස්ථානය හා උත්තරස්ථානය යනුවෙන් ප්‍රධාන කොටස් 6 කට බෙදා විස්තර කර ඇත. වෘඬ සුශ්‍රැතය දැනට අභාවයට ගොස් ඇති බැවින් එහි අඩංගු කරුණු පිළිබඳව අධ්‍යයනය අපහසු වී ඇත. සුශ්‍රැත සංහිතාවේ මූලික අංගය වන්නේ සූත්‍රස්ථානයයි. ආයුර්වේදයේ මූලික බෙදීම් වන අෂ්ටාංග ආයුර්වේදය, ආයුර්වේදයේ ප්‍රයෝජන, ආයුර්වේදයේ පහළවීම පිළිබඳ මතය, රෝගවල ප්‍රධාන බෙදීම්, ශිෂයන් තෝරා ගත යුතු ආකාරය, ක්ෂාරපාක විධි, අගනිකර්මවිධි, වමන හා විරේචන ද්‍රව්‍ය, අන්නපාන විධි, ද්‍රව්‍ය ගුණ, ආතුර උපක්‍රම ආදි ප්‍රධාන මාතෘකා පිළිබඳ විස්තර වේ.

නිදාන ප්‍රධාන රෝග සමූහයකට කාරණ ලක්ෂණ ආදිය නිර්දේශ කර තිබේ. ඒවා නම් වාතව්‍යාධි, අර්ශස්, අශ්මරි, භගන්දර, කුෂ්ඨ, ප්‍රමේහ, උදර, මූඪගර්භ, විද්‍රධි, විසර්ප, නාඩිව්‍රණ, ස්තනරෝග, ස්තන්‍ය ඉපදිමට හේතු, දූෂිත තනකිරි ලක්ෂණ, ග්‍රන්ථි, අර්බුද, ගලගණ්ඩ, වෘද්ධි, උපදංශ, ශ්ලිපද, ක්ෂුද්‍රරෝග, ශුක්‍රරෝග ලක්ෂණ, භග්න, මුඛරෝග, ශුක්‍රය පිළිබඳ ලක්ෂණ, ආර්තව ලක්ෂණ, ඍතුමති පිළිබඳ ලක්ෂණ,

ගර්භ උත්පත්තිය, නින්ද පිළිබඳ ලක්ෂණ, ගර්භ ශරිර විවරණය, ස්ත්‍රී ශරිරයේ විශේෂිත ලක්ෂණ, මර් පිළිබඳ ලක්ෂණ, ශිරා විදිම, ආදි තොරුතුරු ඇතුළත්වේ.

චිකිත්සා ස්ථානයේ ව්‍රණ, චිකිත්සා, භග්න චිකිත්සාව, වාතරක්ත චිකිත්සාව, වාතව්‍යාධි චිකිත්සාව අර්ශස් චිකිත්සාව, අශ්මරි චිකිත්සාව, භගන්දර චිකිත්සාව, කුෂ්ඨ චිකිත්සාව, ශ්වින්‍ර චිකිත්සාව, ප්‍රමේ චිකිත්සා, මධුමේහ චිකිත්සා, උදර රෝග චිකිත්සාව මුඪගර්භ චිකිත්සාව, විද්‍රධි චිකිත්සාව, විසර්ප චිකිත්සාව නාඩිව්‍රණ චිකිත්සාව, ග්‍රන්ථි රෝග චිකිත්සාව, අර්බුද චිකිත්සාව, ගලගණ්ඩ චිකිත්සාව, වෘද්ධි චිකිත්සාව උපදංශ චිකිත්සාව, ශ්ලිපද චිකිත්සාව, ක්ෂුද්‍රරෝග චිකිත්සාව, මුඛරෝග චිකිත්සාව, හා නිදානදියේ දැක් සියලුම රෝග වලට චිකිත්ස ද දැක්වේ.

එමෙන්ම සද්වෘතය, වාජිකරණය, රසායන ප්‍රයෝගය, සෝමසේවන විධිය, මාන විවරණය, පංචකර් විධිය, ඇතුළත්වේ.

කල්පස්ථානයේ විෂ පිළිබඳ විස්තර,(ජංගම විෂ හා ස්ථාවර විෂද) සඳහන් වේ.

අවසන් පරිච්ජේදය ලෙස සඳහන් වන්නේ උත්තර තන්ත්‍රයයි. මෙහි ආරම්භයේදි ම සඳහන් වන්නේ මෙම කොටස ධන්වන්තරි සෘෂිහු සුශ්‍රැත ශිෂ්‍යයාට කි පරිදි ප්‍රකාශ කරන බවයි. මෙහි අඩංගු දෑ ලෙස විස්තර වන්නේ ඒ ඒ වෙනස් ඇත්තාවූ රෝගද, රසසය සංයෝගව උපදනා තෙසැම වැදෑරුම් වු රසයන්ද, සවස්ථවෘත්තයද, යුක්තාර්ථයන්ද, තන්ත්‍රයුක්තින්ද, දෝෂභේද හා ශමනෝපාය සමුහයද, යන මේ කාරණය. මෙහිදි රෝග යටතේ ශිර්ෂයේ උපදිනා රෝග සියල්ලම විස්තර කෙරේ. ජ්වරරෝග විවරණය, අතිසාරය, ග්‍රහණි, ශෝෂය, රාජයක්ෂ්මා, ගුල්ම, ශුල, හෘද්රෝග, පාණ්ඩු, රත්පිත්, මුර්ච්ජා, මද්‍යගුණ, තෘෂ්ණා, චිකිත්සා, ජර්දි, හික්කා, ශ්වාස කාස, ස්වරභේද, ක්‍රිමි, උදාවර්ත, විසුචිකා, අලසක, අනාහාය, අරුචි, මුත්‍රාරෝග, ග්‍රහරෝග, අපස්මාර, උන්මාද, සෘතුවර්‍යා, තන්ත්‍ර යුක්ති, ආදි වු විස්තරය වේ.

මේ අධ්‍යාය නාගාර්ජුන පාදයන් විසින් රචිත යැයි සියලු විද්වතුන්ගේ මතය වුවද මෙහි වෛද්‍යමය තොරතුරු හැරෙන්නට තම ආගමික හෝ දාර්ශනික මතවාද කිසිවක් ඇතුළත් නොකරන්නට වගබලා ගෙන තිබිම එහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි. වෛද්‍ය විද්‍යාව සමස්ත ප්‍රජාවගේ අයිතියක් බවත් ඒ තුළට සංස්කෘතිකමය අංගයන් හෝ මතවාද එක් නොකළ යුත්තක් බවත් නාගාර්ජුන පාදයන් සුශ්‍රැතයේ උත්තර තන්ත්‍රය තුළින් ලොව හමුවේ තැබු අද්විතිය පණිවිඩයයි.

---


ආශ්‍රිත ග්‍රන්ථ

1. තිලකරත්න අසංග (2001) ශුන්‍යතාවාදයේ දර්ශනය හා
2. කුමාරසිංහ ආරියදාස (වෛද්‍ය) සංක්ෂිප්ත ආයුර්වේද ඉතිහාසය
3. රොබින්සන් (1976)
4. Murthi (1976)
5. බුද්ධදත්ත හිමි පොල්වත්තේ භාරතිය බෞධාචාර්‍යයෝ.
6. තිලකරත්න අසංග, (2001) ශුන්‍යතාවාදයේ දර්ශනය හා වරකය.
7. Robinson (1955)
8. කුක් : ෆැන්සිස් එච්.හුවාසෙන් මුද්‍රසමය
9. බුද්ධදාස ආර්. සිංහල අනුවාදය සුශ්‍රැත සංහිතාව
10. ධම්සිරි ගුණපාල, ගුණතිලක ඩබ්. එම්. මොක්ෂ මාණික්‍යාභාරනය
11. තිලකරත්න අසංග, ශුන්‍යතාවාදයේ දර්ශනය හා වරකය.
12. Kalupahana (1980)
13. Potter (1999)
14. තිලකරත්න අසංග ශුන්‍යතාවාදයේ දර්ශනය හා වරනය.
15. තිලකරත්න අසංග ශුන්‍යතාවාදයේ දර්ශනය හා වරනය.